# පාසැල් අධ්‍යයන හා පරිපාලන ක්‍රමවේදය තුලින් ආගමික ඇදහිම් ආශ්‍රිතව සිදුවන අකටයුතු කම් සහ විෂය මාලාවන්හි ඇති ගැටළු පිලිබඳව සොයා බැලිමේ පර්යේෂණ වාර්තාව 2017




International Movement Against All Forms of Discrimination and Racism-Asia Committee

සියළු වර්ගවාදයට හා වෙනස්කම් කිරීමට එරෙහි ජාත්‍යන්තර ව්‍යාපාරය - ආසියා කමිටුව

சகல விதமான பாகுபாடு மற்றும் இனவாதத்திற்கு எதிரான சர்வதேச இயக்கம் - ஆசியாவிற்கான குழு


EUROPEAN UNION

# පාසැල් අධ්‍යයන හා පරිපාලන ක්‍රමවේදය තුලින් ආගමික ඇඳහිම් ආශ්‍රිතව සිදුවන අකටයුතුකම් සහ විෂය මාලාවන්හි ඇති ගැටළු පිලිබඳව සොයා බැලිමේ පර්යේෂණ වාර්තාව 2017


**සැකසුම**

**නිරෝෂන් ඒකනායක**



**ව්‍යාපෘති සංකල්පය සහ මෙහෙයවිම**

IMADR

EUROPEAN UNION

පාසැල් අධ්‍යයන හා පරිපාලන ක්‍රමවේදය තුලින් ආගමික ඇඳහිම් ආශ්‍රිතව සිදුවන අකටයුතුකම් සහ විෂය මාලාවන්හි ඇති ගැටළු පිලිබඳව සොයා බැලිමේ පර්යේෂණ වාර්තාව 2017

පලමු සංස්කරණය -2017

හැඳින්වීම:

විවේකානන්ද ස්වාමි අධ්‍යාපනය ලෙස හඳුන්වන්නේ එය මනුෂ්‍යයා තුල පවතින දේවත්වය මතුකර ගැනීමේ ක්‍රියාවලියක්ම ලෙසය.
එබැවින් මිනිසා දිව්‍යමය තත්ත්වයක් ඔස්සේ ගමන් කල යුත්තේ කෙසේද යන යොමුව අපට ලබාදෙන්නේ අධ්‍යාපනය විසිනි.
මිනිසා තිරිසන් සතුන්ගෙන් වෙන් කොට .මානවයකු" ලෙස සංවර්ධනය කිරීමේදී අධ්‍යාපනයට මහඟු කාර්යභාරයක් ඉටු කල හැකිය. මේ තත්ත්වය හොඳින් වටහා ගැනීම නිසා බහුතරයකගේ අවධානය අධ්‍යාපනයට යොමුවී තිබීම සතුටට කරුණකි.

අධ්‍යාත්මික සංවර්ධනය සහ ආගමික ඉගැන්වීම්.
මිනිසාගේ අධ්‍යාත්මික සංවර්ධනයට මහඟු දායකත්වයක් ලබාදෙන ආගමික ඉගැන්වීම් ශ්‍රී ලංකාවේ පාසැල් පද්ධතිය තුල දරුවන්ට ලබා දෙන්නේ කෙසේදැයි විමසා බැලීම වටී. එහෙත් අද ආගම පාසැල තුල විෂයක් බවට පත්ව ඇත. මේ නිසාම එය විභාගයේදී ප්‍රශ්න පත්‍රයට පිලිතුරු සැපයීමට ඇති තවත් එක් විෂයකි. මේ නිසා දරුවන් ආගම ඉගෙන ගන්නේ විභාගයේදී වැඩි ලකුණු ලබා ගැනීමට මිස ඒ ඔස්සේ තමන්ගේ අධ්‍යාත්මය සංවර්ධනය කර ගැනීමට නොවේ. එසේම දරුවා තවදුරටත් තරගකාරී පසුබිමකට තල්ලු කර ඇති අතර දරුවා අධ්‍යාත්මික වටිනාකම් වලින් ඈත් කර ඇති බවක්ද දැකිය හැකිය.

ආගමික ඉගැන්වීම් විෂය මාලාවට ඇතුලත් වීම.
යටත් විජිත සමයේදී මෙරට කතෝලික සහ ඇන්ගිකානු සභාවන් විසින් තමන්ගේ පාලනය යටතේ පැවති පාසැල් වල දරුදැරියන්ට ඉරිදා දහම් පාසල් පැවත්වීමෙන් ආගම් ඉගැන්වීමට කටයුතු කලහ. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයට ආගම ඉගැන්වීම නැතහොත් ආගම විෂය පද්ධතියට ඇතුලත් කිරීමට මේ මිෂනාරි අධ්‍යාපන රාමුව සුවිශේෂී බලපෑමක් කර ඇත.

අදටත් ආගම පාසැලේ විෂය මාලාව තුල ඇත.
මෙහිදී විශේෂයෙන් ආගමික පසුබිමක් තුලින් බිහිවූ බෞද්ධ,ක්‍රිස්තියානි,හින්දු සහ මුස්ලිම් පාසැල් තමන්ගේ පාසැල් තුල තමන් නියෝජනය කරන ආගම සුපිරි ආගමක් ලෙස හුවා දක්වමින් අනෙකුත් ආගම්වලට එවැනි තත්ත්වයක් නොමැති බව අනියම් ලෙස තහවුරු කරමින් ඉගැන්වීමේ කාර්ය කරන නිසා ආගම් අතර කිසියම් තරගකාරී බවක් නිර්මාණය වී ඇති බව පෙනේ.
එසේම ආගමික පදනමකින් යුත් පාසැලක අධ්‍යාපනය ලැබීම දරුවකුට අනාගතයේදී රැකියාවක් ලබා ගැනීමට ධනාත්මකව බලපෑමක් කරන නිසා බොහෝ දෙමාපියන් තමන්ගේ දරුදැරියන්ට ආගමික පදනමක් සහිත පාසැල් වල අධ්‍යාපනය සඳහා යොමුකරවන අතර මෙය මූලධාර්මිකව පාසැල් අධ්‍යාපනයට විශාල හානියක් විය හැකිය.

අනිත් ආගම් කෙරෙහි වැරදි නිගමන වලට එළඹීම.
තමන් අදහන ආගම පිළිබඳව පමණක් අධ්‍යයනය කිරීමෙන් වෙනත් ආගම් කෙරෙහි කිසියම් වෛරී දෘෂ්ටියකින් බැලීමට දරුවන් යොමුවන අතර එය ගැටුම්කාරී තත්ත්වයකට මූලික පදනමක් විය හැකිය. මෙසේ වන්නේ එම ආගමික සංකල්ප ඉතා උසස් සහ පරම සත්‍යය ලෙස උගන්වන නිසාය. අතීතයේ ඒ ඒ කාල වකවානුවල පැවති තත්ත්වයනට ප්‍රතිචාර දැක්වීමක් ලෙස ආගමික පදනමකින් යුත් පාසල් බිහි කිරීමට ඒවායේ නිර්මාතෘවරුන් යොමු වුවත් බහුවාර්ගික සහ බහුආගමික සමාජයක් තුල මෙය රටේ අවශ්‍යතාවයන්ට අනුව කාලානුරූපව වෙනස් විය යුතුව තිබුනත් එය එසේ සිදුවූයේ නැත.
පොදු ලාංකික අනන්‍යතාවයට එරෙහිව ආගමික අනන්‍යතාවයක් නිර්මාණය වීම.
මේ නිසා පොදු ලාංකිය අනන්‍යතාවයක් පාසැල තුලින් ගොඩ නගනවා වෙනුවට එකි නෙකට වෙනස් වාර්ගික, භාෂාමය සහ ආගමික අනන්‍යතාවයන් නිර්මාණය කිරීමට මේ රටේ අධ්‍යාපනය සෘනාත්මකව දායකත්වයක් ලබාදී ඇත.

වර්තමානයේ පවතින සිංහල බෞද්ධ, සිංහල ක්‍රිස්තියානි,දෙමල හින්දු,දෙමල ක්‍රිස්තියානි සහ මුස්ලිම් යන තත්ත්වය වෙනස් වන .සර්වාගමික සාරධර්ම" තුලින් පොෂිතවූ අධ්‍යයන මෙවලම් නිර්මාණය කර ගැනීමේ අවශ්‍යතාවක් ඇත.
යුද්ධය පැවැති සමයේ එල්.ටී.ටී.ඊ. සංවිධානයෙන් වැඩි තර්ජනයක් එල්ල වුයේ සිංහල බෞද්ධ පාසැල් වලටය. එයට හේතුව වුයේ එවැනි පාසැල් වලින් දැඩි සිංහල මතධාරීන් බිහිකරන බව ඔවුන් විස්වාස කිරීමයි. එසේම දෙමල හින්දු පාසැල් වලින්ද මෙලෙස දැඩි දෙමල මතධාරීන් බිහිකිරීමට අවශ්‍ය පසුබිම සකස් වී ඇත.
මෙම තත්ත්වය තවදුරටත් පැවතීම සංහිඳියාව ක්‍රියාවලියට ඍජු බාධාවක්වේ. මක්නිසාදයත් පාසැල් සිසුන්ගේ චර්යාවන් සහ ක්‍රියාකාරකම් සදහා පදනම වැටෙන්නේ ඔවුන් ලබන අධ්‍යාපනය තුලින් බව විද්වතුන් සනාත කර ඇත.

ජනතාව තුල බෙදීම් ඇති කිරිමට ආගම දක්වන දායකත්වය.
නිදහසින් වසර 70කට පසුවද මේ ආගමික සහ ජනවාර්ගික පදනම මත පාසැල් වැඩි වැඩියෙන් ආරම්භ වන තත්ත්වයක් දකින්නට ඇත. මෙයින් ගම්‍ය වන්නේ අධ්‍යාපන ආයතන තුලින්ද ජනතාව වෙන් කිරීමට උත්සාහ කරන කොටස් වලට උදව් කිරීමකි.
මේ නිසා පාසැල් පද්ධතිය නිරාගමික වනසේ සකස් කිරිම සහ විෂය මාලාවන් ගෙන් ආගම ඉවත් කර පවත්වාගෙන යාමට අනාගතයේ සහජීවනයට මහත්වූ රුකුලක් වනු ඇත.
එක් එක් ආගම් වෙන් වෙන්ව ඉගැන්වීම මානව සබඳතාවලට බලපාන බව සරල යථාර්ථයකි. විෂයක් ලෙස ඉගැන්වීම තුලින් ආගමික වටිනාකම් සංහිඳියාවට සම්බන්ධ කර ගත හැකිවුද සැමවිටම තමන්ගේ ආගම උසස් ලෙස සැලකීම නිසා එයින් බෙදී සිටීමට සහ අනිත් ආගම් වලට වෛර කිරීමට ඇති ප්‍රවනතාවය වැඩිය.

ආගමික ඉගැන්වීම් වල බලපෑම තාර්කිකව තේරුම් ගැනීම.
ඉහත සඳහන් කර ඇති පරිදි පාසැල් අධ්‍යාපනය තුල වාර්ගික සහ ආගමික විවිධත්වයට බාධා පමුණුවන ප්‍රායෝගික සහ න්‍යායාත්මක කරුණු ගනනාවක් පවතින බව අවිධිමත් තලයේ පැවති සාකච්ජා සහ කතිකාවන් තුලින් හදුනාගෙන තිබුනද ඒ පිලිබඳව විධිමත් අධ්‍යනයක් සිදු කර නොමැත.

එබැවින් මෙසේ වාර්ගික සහ ආගමික විවිධත්වයට බධා පමුණුවන කරුණු නිවැරදිව හදුනාගෙන ඒ සඳහා විකල්ප යෝජනා ඉදිරිපත් කරමින් ඒවා නිසි පරිදි ක්‍රියාත්මක කල යුතු වන්නේය.

ඒ සඳහා ක්‍රමවත් අධ්‍යයනයක් සඳහා යොමුවීමට සියලු වර්ගවාදයන්ට සහ වෙනස් කිරීමට එරෙහි ජාත්‍යන්තර ව්‍යාපාරය (අසියානු කමිටුව) (IMADR-AC) තීරණය කරනු ලබන්නේ එවැනි අධ්‍යයනයක දැවෙන අවශ්‍යතාවයක් පවතින අතර එයින් හදුනා ගන්නා කරුණු පවතින තත්ත්වයන්ට විකල්ප ලෙස ක්‍රියාත්මක කිරීමෙන් මේ රටේ සංහිඳියාව සහ සහජීවනය වඩා සාධනීය තලයකට ඔසවා තැබිය හැකි බව විස්වාස කරන නිසාය.

විද්‍යානුකුල අධ්‍යයනයක නිරතවීම
ශ්‍රී ලංකාවේ විවිධ දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි මෙම අධ්‍යයනය දියත් කරනු ලැබීය.
ඒ සඳහා සිංහල,දෙමල සහ මුස්ලිම් බහුතර ජනයා වෙසෙන ප්‍රදේශ මෙන්ම සියලු ජන කොටස් ජීවත් වන ප්‍රදේශවල පාසැල් දරුවන්, දෙමාපියන් ගුරුවරුන් සහ අදාල පාසැල් වල පාසැල් සංවර්ධන කමිටු සාමාජිකයන්ද මෙම අධ්‍යයනයට සහභාගි කර ගැනුනි.
මෙම අධ්‍යයනය තුලින් පවත්නා තත්ත්වය පිළිබඳව සොයා බැලීමත්, වාර්ගික සහ ආගමික වෙනස්කම් අවම කොට අන්තර් ආගමික සහජීවනය සහ සහෝදරත්වය ගොඩ නැගීම පිනිස පාසැල් කාලයේ සිටම දරුවන්ගේ ආකල්ප සංවර්ධනය කිරීමට සුදුසු යෝජනා ඉදිරිපත් කිරීමටද වෑයම් කරයි.

ජාතික  අධ්‍යාපන ප්‍රතිපත්තියේ මූලික අරමුණු වන්නේ.

1.
2"

මෙම අරමුණු සක්ෂාත් කරගැනීමට බාධාකාරී වන ආයතනික,සමාජීය සහ  සංස්කෘතික සාධක හඳුනා ගැනීමත් ඒවාට නිසි පිලියම් යෙදීම සඳහා සුදුසු ක්‍රමවේදයන් සහ යෝජනා ඉදිරිපත් කිරීමත් මෙම අධ්‍යයනයෙන් අපේක්ෂා කරන ලදි.

අධ්‍යයනය  ආවරණය කරනු ලැබූ ඉසව්වන්. මෙම අධ්‍යයනයේදී

1. ශ්‍රී ලංකාවේ පාසැල් තුල ඉගැන්වෙන ආගමික සංකල්ප සහ ප්‍රායෝගිකවත්වය හදුනා ගැනීම.
2. වාර්ගික සහ ආගමික සංහිඳියාව ගොඩනැගීමට ඇති ඉඩ ප්‍රස්ථා සොයා බැලීම.
3. ආගමික හා වාර්ගිකත්ව මත පදනම් වන පාසැල් වලට බලපාන විශේෂ නීතිරීති රෙගුලාසි සහ භාවිතයන් පිළිබඳව සොයා බැලීම.
4. වර්තමානයේ පාසැල් පද්ධතිය තුල වාර්ගික සහ ආගමික සහජීවනය පවතිද එසේ නැතිනම් ඒ සඳහා පවතින බාධාවන් මොනවාද යන්න සොයා බැලීම.
5. අධ්‍යයන තේමාවන්ට අදාල සිද්ධි අධ්‍යයනයන්, මාධ්‍ය වාර්තා හා විෂය මාලා ඒකරාශී කර ගැනීමත් සෙසු අරමුණු අතර විය.

ඉදිරිපත් කරනු ලැබූ ප්‍රශ්නාවලිය.
ඒ අනුව පලමු පියවර ලෙස පාසැල් පද්ධතිය තුල ආගමික සමාජීය පරිසරය පිලිබඳව සොයා බැලීම සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පහත දැක්වෙන ප්‍රශ්නාවලිය ඉදිරිපත් කෙරුනි.

1. ඔබ අයත් වන්නේ වාර්ගික හෝ ආගමික පදනමින් හදුන්වන පාසලකටද?
2. ශ්‍රී ලංකාවේ පාසැල් තුල ඉගැන්වෙන ආගමික සංකල්ප සහ ප්‍රායෝගික තත්ත්වයන් කවරේද?
3. ඔබගේ ආගමික ඇදහීම් සුදුසු පරිසරයක් පාසලේ පවතිද?
4. ඔබව ආගමික සහ වාර්ගිකත්වය මත වෙනස් කිරීමකට ලක්වී තිබේද?
5. පාසැලේ පවත්වන ආගමික වැඩසටහන් මොනවාද?
6. ආගමික කටයුතු සඳහා ඔබට බලපාන  ප්‍රධාන නීති රීති හෝ සම්ප්‍රදායන් තිබේද?
7. පාසැල තුල ආගමික සහජීවනය ගොඩනැගීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද?
8. මුස්ලිම් පාසැල් දරුවන්ට බලපාන විශේෂ නීතිරීති යන කරුණු කෙරෙහි මූලික  අවධානය යොමු කරමින් ප්‍රශ්නාවලිය සකස් කරනු ලැබීය.

ප්‍රශ්නාවලිය හරහා කරුණු රැස් කර ගැනීමට සමීක්ෂකයින් විසින් දරු දැරියන්,දෙමාපියන්, ගුරුවරුන් යොදා ගෙන විවිධ මට්ටමෙන් තොරතුරු රැස් කර ගනු ලැබීය"
මීට අමතරව අධ්‍යයනයට අදාල දත්ත රැස් කිරීම සහ විශ්ලේෂණය සඳහා පන්ති කාමර නිරීක්ෂණය වැනි පොදු උපක්‍රම යොදා ගත් අතර පරිපාලන ක්‍රමවේදයන්ට අදාලව චක්‍රලේඛණ, අණ පනත්,නියෝග සහ සටහන්ද උපුටා ගනු ලැබුනි.

නිර්දේශ ඉදිරිපත් කිරීම.

එසේ රැස් කරගත් දත්ත විශ්ලේෂණය කර ගැනීමෙන් අනතුරුව ප්‍රතිපත්ති සම්පාදනයට වැදගත් වන නිර්දේශයන්, ගුරුවරුන්ගේ සහ දරුවන්ගේ වර්ධනය විය යුතු අංග හා හඳුන්වා දිය යුතු නව අධ්‍යයනය මෙවලම් නිර්දේශ කිරීමටද මෙයින් අපේක්ෂා කරයි.

මෙම යෝජනා සහ නව නිර්දේශ වාර්ගික සහ ආගමික සංහිඳියාව ගොඩනැගීමේ ක්‍රියාවලිය සැලසුම් කිරීමේදී අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළව සැලසුම් කිරීම, මෙහෙයවීම සහ අධීක්ෂණය සඳහා ඉවහල් වනු ඇත.  එසේම මෙම අධ්‍යයන වාර්තාව මූලික ආගමික ඉගැන්වීම් යොදා ගනිමින් සංහිඳියා යාන්ත්‍රනය ශක්තිමත් කිරීමට රාජ්‍ය සහ රාජ්‍ය නොවන අංශයන්ට මග පෙන්වනු ඇත.

අධ්‍යයනය තුලින් හඳුනාගත් මූලික කරුණු කිහිපයක්. **සවිස්තරාත්මකව අධ්‍යයනයේ සියළු තොරතුරු** වර්තාව තුලින් ඉදිරියේ දක්වා ඇති අතර මෙහිදී සුවිශේෂී  අවධානයක් යොමු කල යුතු අධ්‍යයනය තුලින් සොයාගනු ලැබූ මූලික කරුණු කිහිපයක් වාර්තාව හැඳින්වීම යටතේ පහත සඳහන් කර ඇත.

1. නිදහස ලැබීමට පෙර සිටම මානව සංවර්ධනයේ ප්‍රධාන  අංගයක් ලෙස අධ්‍යාපන ක්ෂේත්‍රය සංවර්ධනකිරීම සඳහා සෑම රජයක්ම විශේෂ අවධානයක් යොමුකර ඇත.
2. අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධ කර ගෙන ජාතික සමගිය සහ සංහිඳියාව ගොඩ නැගීමට දියත් කර ඇති වැඩසටහන් සහ උත්සාහයන්  ඉතාමත් අල්පය.
3. එසේ ක්‍රියාත්මක කල වැඩසටහන් වල වුවද මානව ගරුත්වය, සමානාත්මතාවය සහ සමාජ සාධාරණත්වය   පදනම් කර නොතිබුනි.
4. සම්පත් බෙදීයාමේ විෂමතාවයක් ඇත. වාර්ගික සහ ආගමික පදනම මත අසාධාරණයක් වී ඇත.
5. තිරසර  ජාතික ඒකාබද්ධතාව සහ සහජීවනය ගොඩ නැගීමේදී අධ්‍යාපන  අංශය තුල ඇති වාර්ගික සහ ආගමික පදනම මත ඇති බෙදීම් නැති විය යුතුය.
6. යටත් විජිත සමයට පෙර පවා ලංකාවේ ඉතා ක්‍රමවත් පවත්වාගෙන යනු ලැබූ අධ්‍යාපන ක්‍රමයක් තිබුනි.
7. අතීතයේ පැවතියේ පිරිවෙන් අධ්‍යාපනයකි. එබැවින් වැඩි වශයෙන් අධ්‍යාපනට යොමුවූයේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා වූ අතර ගිහියන්ගේ සහභාගිත්වය පැවතියේ ඉතා සුළු වශයෙනි.
8. මේ පිරිවෙන් අධ්‍යාපනයෙන් බිහිවූ පිරිස් ආගමික පදනමකින් බෞද්ධ සංස්කෘතිය ඉස්මතු කරමින් අධ්‍යාපනය පවත්වාගෙන යාමට වැඩි දායකත්වයක් ලබාදී ඇත.
9. දෙමාපියන්ගේ වෘත්තියමය බලපෑමට අනුව ගෘහ මූලික අධ්‍යාපනයක් දරුවන්ට ලැබුනද එය ඉතා අල්පය. කාන්තාව ගෘහනියක් ලෙස  නිවසේම රැඳී සිටියාය.
10. යටත් විජිත සමයේ සිදුවූ ප්‍රතිසංස්කරණය  අපගේ අධ්‍යාපනයට සුවිශේෂ බලපෑමක් කර ඇති අතර ආගමික  ඉගැන්වීම් පාසැලට ඇතුල් වන්නේද එම කාලයේදීය.
11. යටත් විජිත සමයේ සහ ඉන් පසුව මිෂනාරිවරුන් තමන්ගේ ආගමට සම්බන්ධ අයට විශේෂ වරප්‍රසාද දැක්වීම නිසා ඊට ප්‍රතිචාර දැක්වීමක් ලෙස තමන්ගේ  ආගම ඉස්මතු කරවන ජාතිවාදී කණ්ඩායම් රට තුල ඇතිවූ අතර බෞද්ධ, හින්දු සහ මුස්ලිම් පාසැල් බිහිවන්නේ  එවකට පැවති කතෝලික/ක්‍රිස්තියානි පාසැල් වලට විකල්ප ලෙසය.

මෙහිදී සිංහල බෞද්ධයන් වෙනුවෙන් අනගාරික ධර්මපාල තුමා, දෙමල හින්දු ආගමිකයන් වෙනුවෙන් ආරුමුගම් නාවලර් තුමා සහ මුස්ලිම් ජනකොටස වෙනුවෙන් ටී.බී.ජයා මැතිදුන් පුරෝගාමීව කටයුතු කර ආගමික පදනමකින් යුත් පාසැල් බිහි කලහ.

## අධ්‍යයනයේ පසුබිම

ජීවිතයේ වැදගත් සංධිස්ථානයක් ලෙස අවිධිමත් අධ්‍යාපනයෙන් පසුව විධිමත් අධ්‍යාපනයට පිවිසෙන අවස්ථාව සැලකිය හැක. නිදහස් මනසකින් යුතු දරුවන්ගේ මනසට විවිධ ආකල්ප ඇතුලත් කිරීමට මේ කාලයේදී ගුරුවරුන්ට සහ දෙමාපියන්ට හැකියාව ලැබේ. අධ්‍යාපනික විෂය මාලාව තුල ආගම විෂයක් ලෙස ඇතුලත් විමෙන් දරුවන්ගේ නිදහස් මනස ක්‍රමනාකූලව වර්ගවාදයන් සහ ආගමික හිංසනයන් කරා ආකල්ප වර්ධනය විමට හේතුවක් වී ඇත. මේ නිසා මෙම අධ්‍යයනයේදී පාසැල් අධ්‍යාපනය හා පරිපාලන ක්‍රමවේදය තුලින් ආගමික ඇඳහීම් ආශ්‍රිතව සිදුවන අකටයුතුකම් සහ විෂය මාලාවන්හි ඇති ගැටළු පිලිබඳව සොයා බැලිමට උත්සහ ගනු ලැබුනි.

මෙම අධ්‍යයනය සඳහා 10 වන ශ්‍රේණයේ සිට උසස් පෙල දක්වා අධ්‍යාපනය ලබන සිසු දරු දැරියන්ගෙන් , දෙමව්පියන්, පාසැල් සංවර්ධන කමිටු සාමාජිකයන්, ගුරුවරුන් සහ බාහිර කණ්ඩායම් ආදියගෙන් තොරතුරු සම්පාදනය කර ගනු ලැබුනි. මේ සඳහා මහනුවර, මාතලේ, නුවරඑළිය, රත්නපුර, අම්පාර, හම්බන්තොට,ගාල්ල ,අනුරාධපුරය තුල සමික්ෂණය දියත්කරන ලදි. මේ සඳහා 500 අධික සිසු දරු දැරියන් පිරිසක් සමික්ෂණයට භාජනය කරගනු ලැබුනි. විෂය මාලා ආශ්‍රිත ආගමික ඉගැන්විම් සහ ප්‍රායෝගික තත්ත්වයන් පාසලේදී මුහුණ දෙන සමික්ෂනයට ලක් කෙරුනි. සිංහල, දෙමළ, මුස්ලිම්, සහ කතෝලික යන පාසැල්ද මිශ්‍ර , ජාතික පාසැල් ද, පලාත් සහ ගම්බද පාසැල්ද වන සේ විවිධ වර්ගිකරණයක් යටතේ පාසැල් සමික්ෂනයට භාජනය කෙරුනි. පිරිමි පාසැල්, බාලිකා පාසැල් ලෙසද කණ්ඩායම් නිරික්ෂණයයේදී අවධානය යොමු කෙරුනි. පාසැල් පද්ධතිය ආශ්‍රයෙන් දරුවන් මුහුණ දෙන අභියෝගයන් සහ බාධක සොයා බැලිමටත් මෙම අධ්‍යයනයේදී උත්සහ කරන ලදි.

## අධ්‍යයන ක්‍රමවේදය

සමික්ෂනයන් සහ නිරික්ෂනයන් විධිමත් න්‍යායත්මක ක්‍රමවේදයක් ඔස්සේ දියත් කිරිමට කටයුතු කළ අතර තොරතුරු විශ්ලේෂනය සඳහා පර්යේෂන ක්‍රමවේදයන්ට අයත් සෑම අංගයක්ම යොදා ගනු ලැබුනි. අධ්‍යයනයට අදාලව ප්‍රාථමික දත්ත එක් රැස්කර ගැනිම සඳහා විවිධ ක්‍රමෝපායන් යොදා ගැනුණි. ඒවා නම්

- නිරික්ෂණයන් (පොදු සහ පන්ති කාමර)
- සම්මුඛ සාකච්ජා (තනි සහ කණ්ඩායම්)
- ප්‍රශ්නාවලියක් ලබා දිම (සිසුන්ට/දෙමාපියන්ට/ගුරුවරුන්ට)
- සිද්ධි අධයනයන්
- පුවත්පත් ලිපි සහ උපුටනයන්
- අන්තර්ජාල වෙබ් අඩවි සහ බිලොග් අඩවි යන ක්‍රම මගින් දත්ත එක් රැස් කරගන්නා ලදි
- එයට අමතරව විෂය නිර්දේශ, චක්‍රලේඛණ උපුටා ගැනිම් සහ විෂය නිර්දේශ මාර්ගෝපදේශ සංග්‍රහයන් වලින්ද උපුටා ගැනිමද සිදු කරනු ලැබුනි.

## අධ්‍යාපන විෂය මාලාවන් සහ ආගමික විශ්වාසයන් පිලිබඳව සොයා බැලිම

සිසු දරුවන්,දෙමාපියන් සහ ගරුවරුන්ගේ වර්තමාන තත්ත්වය සොයාබැලිම සඳහා ප්‍රශ්නාවලියක් ලබා දෙන ලදි. එහිදි ඔවුන් ලිඛිතව අදාල ප්‍රශ්නාවලියට පිලිතුරු සපයා තිබුනි. ඉන් අනතුරුව සාමාන්‍ය සහ පන්ති කාමර නිරික්ෂනයන් හරහා තොරතුරු රැස්කර ගන්නා ලදි. එසේම සම්මුඛ සාකච්ජා ආශ්‍රයෙන් මෙම ප්‍රශ්නයට පිලිතුරු ලබා ගැනිමට කටයුතු කෙරුනි. පුවත්පත් හි පල වූ ලිපි මගින්ද තොරතුරු රැස් කර ගතිමි.

## අධ්‍යනය සාර්ථක කිරිමට තිබු බාධාවන් සහ සිමා සහිතකම්

නියැදියක් ලෙස 10 වන ශ්‍රේණියේ සිට උසස් පෙල දක්වා සිසුන්ව යොදා ගැනිම නිසා සිමාන්තිකව තොරතුරු රැස්කර ගැනිමට සිදුවිය. අනෙක් අතට ප්‍රාථමික සහ ද්විතික අංශ වල සිසුන්ගෙනුත් තොරතුරු රැස්කර ගැනිමට කාල අවකාශයක් තිබුනේ නම් තව දුරටත් අධ්‍යයනය පුළුල් කර ගැනිමට ඉඩ ප්‍රස්ථාව තිබුනි. මානව සම්පතෙහි හිඟකම සම්බන්ධිකරණය සහ සමික්ෂකයන් ලෙස යොදා ගැනිමට හැකි පිරිස අඩු විම , මූල්‍යය සම්පත් වල අඩු පාඩු සහ රාජ්‍ය ප්‍රතිපත්තන්හි ඇති ගැටළුද බාධාවන් ලෙස ඇති විය. අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැලි සේවකයන්ගේ ආකල්ප මෙම අධයනයට බෙහෙවින් බාධාකාරි විය.

## දත්ත විශ්ලේෂණය


මෙම සමීෂක්ෂණය පාසැල් සිසුන් 500 කණ්ඩායමක් හරහා සිදු කරනු ලැබුනි. 10 වන පන්තියේ සිට උසස් පෙළ දක්වා සිසුන් මේ සඳහා සහභාගි විය. බහුතරයක් රජයේ පාසැල් වල නාගරික පරිසරයන්හි ජිවත් වන අයගෙන් යුක්ත විය. සමීෂක්ෂණය ආරම්භයේදි සිසුන් බොහෝ දෙනෙක් තමන්ගේ ආගම හා ආගම විෂයක් ලෙස හැදැරිම පිලිබදව අදහස් දැක්විමට මැලි විය.

සමික්ෂනය සදහා මුහුණ දුන් සිසුන් බහුතරයකට ආගමික දර්ශනය පිලිබඳව වැටහිමක් නොතිබුනි. ඔවුන් ආගමික වතාවත් පිලිපැදිම සිදුකරනු ලැබුවේ ඉතාම අල්ප වශයෙනි. පෙර සඳහන් කල පරිදි ප්‍රශ්නාවලියක් ලබා දිමෙන් සමික්ෂණයට සහභාගි වූ සියළු දෙනාගේම අදහස් විශ්ලේෂනය කිරිමට මෙම පරිච්ජේදයෙන් අදහස් කෙරෙයි. ගරුවරුන් දෙමාපියන් ආදි සියළු දෙනාගෙම අදහස් සැලකිල්ලට ගෙන මෙම විග්‍රහය සිදු කරනු ලැබේ.


දිවයිනේ දිස්ත්‍රික්ක ගණනාවක සිංහල දෙමළ මුස්ලිම් කතොලික පාසැල් සහ සිසුන් ඉලක්ක කරගෙන මෙම තෙරතුරු රැස්කර ගනු ලැබුනි. ආගම විෂයක් ලෙස හැදැරිමේ ඔවුන්ගේ මූලික ආකල්ප සොයා බැලිම සහ මුහුණ දෙන ගැටළු හඳුනා ගැනිමටත් අවශ්‍යය තත්වයන් හිදි විසඳුම් යෝජනා කිරිමටත් මෙම අධ්‍යයනය තුලින් හැකිවිය.

සමීක්ෂනයේ දෙවන පියවර ලෙස පාසැල් වල ස්වභාවය හඳුනා ගැනීම සඳහා ප්‍රශ්නාවලිය සකස් කෙරුනි. ඒ අනුව සමීක්ෂණයට සහභාගිවූ පාසැල් සිසු දරු දැරියන්,ගරුවරුන් සහ දෙමාපියන් සම්බන්ධ පාසැල් වල ස්වභාවය පහත පරිදි වේ. ඒ අනුව ශ්‍රී ලංකාව පුරා විහිදි ඇති විවිධ වර්ගීකරණයන්ට අයත් පාසැල් තුළ මෙම සමීක්ෂණය දියත් කළ අතර ඒ අනුව 10% බාලක පාසැල්ද, 30% බාලිකා පාසැල්ද, 60% මිශ්‍ර පාසැල්ද, ආවරණය වන පරිදි අධ්‍යනය දියත් කෙරුනි. මෙයින් බාලිකා පාසැල් වල සමීක්ෂණය දියත් කිරීමට අපහසුතායවයන් සහ බාධාවන් පැන නැගුණි. විදුහල් වල විවිධ පරිපාලනමය කරුණු නිසා ප්‍රතික්ෂේප වූ අවස්ථා බහුලව දැක ගත හැකිය. මුස්ලිම් කාන්තා පාසැල් වල ආගමික සහ සංස්කෘතික පරිසරයන්ට අනුව දත්ත රැස්කිරීම අසීරු විය.


පාසල් වල ස්වභාවය




සමීක්ෂණයට භාජනය වූ මෙම පාසැල් අතරින් ආගමික පදනම මත කරන ලද වර්ගීකරණයට අනුව පාසැල් වල ස්භාවය පහත පරිදි ඉදිරිපත් කල හැක.




සමීක්ෂණය සඳහා මෙම අධ්‍යනය තවදුරටත් පුළුල් කරමින් පලාත් සහ ජාතික පාසැල් යන වර්ගීකරණ යටතේද දියත් කරමින් තොරතුරු සම්පාදනය කර ගනු ලැබුනි.




සමීක්ෂණයේ මීලග පියවර ලෙස සමාජ සහ ආගමික පසුබිම සොයා බලන ලදි. එහිදි තමන්ගේ ආගම පාසැල තුල ඇදහිමට පරිසරයක් තිබේද යන ප්‍රශ්නයට 90% පමණ ඔව් යන පිලිතුරු දි තිබුනි. එහෙත් නිරික්ෂණයන් සහ අවිධිමත් ලෙස සොයා බැලිමේදී දැන ගත හැකි වුයේ වෙනත් ආගම් අදහන සිසුන්ට එම නිදහස ඉතාමත් අඩු බවයි.

බෞද්ධ පාසැල් වල ඉගෙනුම ලබන වෙනත් ආගමික කණ්ඩායම් සඳහා එම නිදහස අඩු බව පෙණුනි. මේ නිසා ප්‍රධාන ධාරාවේ ආගම ඇදහිම හෝ එම අවස්ථාවේ නිශ්ශබ්දව සිටින බවක් දැකිය හැක.මේ තත්ත්වයම මුස්ලිම් පාසල් වල ඉගෙනුම ලබන බෞද්ධ සහ හින්දු දරුවන්ට අත් විදිමට සිදුවි තිබෙනු දැකිය හැකි විය.




සමික්ෂයෙන් මීලගට අවධානය යොමු කරන ලද්දේ ආගම්ක සහ වාර්ගික වෙනස් කිරිමකට ලක්වි ඇත් ද යන්න සොයා බැලිමටයි. මෙම ප්‍රශ්ණයට අදාලව නැත යන පිලිතුර 100% විය. නමුත් සෘජු ලෙස නොවුනත් බහුතරයක් සිටින අවස්ථාවන්හිදි සුළුතර කණ්ඩායමක් යම් වෙනස් කිරිමකට ලක්වන අවස්ථාද ඇත.

ආගමික වෙනස්කම් වලට ලක් වු අයගේ තොරතුරු සහ අත්දැකිම් එක්රැස් කර ගැනිමට කටයුතු යොදා ගැනිමේ දි තොරතුරු ලබා දිමට අකමැති කමක් දිස්විය. දිනපතා සිදුවන ආගමික ඇදහිලි චාරිත්‍ර සහ උත්සව සැමරුම් නිසා යම් ශිෂ්‍ය කොටසක් පීඩාවට පත් වන බව පෙනේ. ඇතැම් චක්‍රලේඛණ සහ නියෝගයන්ද ආගමික සැමරුම් වලට අනුබලය දෙන බැවින් සුළුතර ආගමික කණ්ඩායම් වලට සෑම පාසැලකදිම අවහිරතා සහ බාධක මතුවේ. ජාතික සහජිවනය ගොඩ නැංවිමට ඇතැම් විට විෂය මාලාවන්හි මඟපෙන්විමක් තිබුනත් ආගමික විශ්වාසයන් එයට එරෙහිව කටයුතු කරනු දැකිය හැක.


වාර්ගික සහ ආගමික පරිසරය පාසැල් තුල ප්‍රවර්ධනය කිරිමට වැඩි බලපෑමක් පාසැල් සංවර්ධන සමිති මගින් ඉටු කරන බව නිරික්ෂණයන් තුලින් හෙලිවිය. සම්ප්‍රදායන් සහ ආගමික බලපෑම් අඛණ්ඩව සිදුකරනු ලබන ව්‍යුහයක් ලෙස පාසැල් සංවර්ධන සමිති පෙන්වා දිය හැක. මොවුන් නව වෙනස් කිරිම් පාසැල් තුලට ගෙන එනවාට තදින්ම විරුද්ධ වන අතර විරෝධතා දියත්කරයි. උදාහරණයක් ලෙස සමික්ෂණය දියත්කරන කාලයේදි මුස්ලිම් බාලිකා පාසැලක විදුහල්පතිනිය සිදුකරණ ලද ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරිමට බාධා පමුණුවමින් එයට විරුද්ධව කටයුතු කිරිමට මුස්ලිම් ආගමික නායකයන්ව පොලඹවමින් කටයුතු කරන ලද්දේ පාසැල් සංවර්ධන කමිටු සාමාජිකයන් විසින් බව පෙන්වා දිය හැක. ආදාල අවස්ථාවේ අන්තවාදි ලෙස කටයුතු කරන පාලක මණ්ඩලයක් පැවැතියහොත් ඒ ඔස්සේ පාසැල මෙහෙයවනු දැකිය හැක. පසුව සමික්ෂණයේ ඊලග පියවර ලෙස පාසැල තුල ආගමික සහජිවනය ගොඩනැගිමට ඇති ඉඩ ප්‍රස්ථා ඇත්ද යන්න සොයා බලන ලදි. ඒ අනුව සමික්ෂණයට සහභාගිවුවන්ගෙන් 90% ක් දෙනා සදහන් කර අත්තේ ඒ සඳහා ඉඩ ප්‍රස්ථා ඇති බවත් ඒ වෙනුවෙන් ගන්නා උත්සහයන් සහ ක්‍රියාකාරකම් ඉතාම අඩු බවකි.



### අධ්‍යයනයට අදාල පන්ති කාමර සහ පොදු නිරීක්ෂණයන්


සමීක්ෂණයට සම්බන්ධවු සියළුම දිස්ත්‍රික්කයන් හි තෝරාගත් පන්ති කාමර වල නියැදි පරීක්ෂණයක් ලෙස පන්ති කාමර නිරීක්ෂණයේ යෙදුනි. මෙහිදි ආගමික සහ සංස්කෘතික ජිවන විලාශය,ආගම විෂයක් ලෙස උගන්වන අයුරු වාර්ගික සහ ආගමික හිංසනයට ඉගැන්වීම් සහ විෂය මාලාවන්ගෙන් වන බලපෑම නිරීක්ෂනය කරන ලදි.

අධ්‍යයන කටයුතු වලදි විවිධ ජන වාර්ගික සහ ආගමික අනන්‍යතාවන් සහිත දරුවන්ගේ හැසිරීම් නිරීක්ෂනය කිරිමේදි .නිතරම" සාමුහිකව කටයුතු කරන ප්‍රමාණය 25% ක් පමණ විය. බොහෝ විට යන්න සැලැකිල්ලට ගත් විට එම අගය 60% ක් විය . ඉදහිට සාමුහිකව කටයුතු කරයි යන්නට 10% හා .කලාතුරකින්" සාමුහිකව කටයුතු කරයි යන්නට 05% ක් විය. මෙම අගයන් ජාත්‍යන්තර පාසල් වල සෑම ආගමකම දරුවන් එක්ව කටයුතු කිරිම විශාල වශයෙන් වැඩිබව පෙනුණි. එම පාසැල් වල වාර්ගික සහ ආගමික අනන්‍යතාවන්ට වැඩි ඉඩක් තිබෙන බව නොපෙනේ.





විෂය බාහිර ක්‍රියාකාරකම් සහ ක්‍රීඩා කටයුතු වලදි ඉහත ස්වභාවයම දැකගත හැකිවිය . මෙම තතත්වයට හේතු වනනේ තරඟකාරීත්වය ක්‍රීඩාවේ ජීව ගුණයට ආගමික සහ වාර්ගික වෙනස්කම් මතු නොවිමයි. එකම ජන වර්ගයන්ට අයත් සිසුන් සහ ගුරුවරුන් අතර මෙම සාමුහිකත්වය බහුලව ඇති බව පෙන්නුම් කරයි.

## විෂය පරිභාහිර කටයුතු වලදී සිසුන්ගේ හැසිරීම





විවේකි අවස්ථාව, සහ ආහාර ගැනිමේදි එකම අනන්‍යතාවයන් සහිත කණ්ඩායම් එක් රංචුවක් ලෙස කටයුතු කිරමේ ප්‍රවණතාවක් දැකිය හැකිවිය. මේ සඳහා සංස්කෘතික අනන්‍යතා සහිත ආහාර රාටාවන් සහ ආහාර වර්ගයන් වෙනස්කම් බල පෑ ඇති බව නිරික්ෂණයෙන් තහුවරු විය.




අනෙක් ආගම් වලට දක්වන සැලික්ලල සහ ගෞරවයන් පිලිබඳව සොයා බැලිමේදි මතුපිටින් ඉතාම හොඳින් සලකන බව පෙනුනත් හුදකලා කණ්ඩායම් ලෙස තනි තනිව කටයුතු කිරිමේදි සෙසු ආගම් විවෙචනය කරන අයුරු සහ අනිකුත් ආගම් දෙස සැකමුසුව බලන අයුරුත් ආගමික අක්‍රමණයන් සිදු වන බවට කට කතා පිලිබඳවත් සාකච්ජා කරනු දක්නට හැකිවිය. නමුත් ආගම් ඇදිහිමට බාධාවන ලෙස කටයුතු කරනු දක්නට ලැබුනේ ඉතාම මද වශයෙනි.

## අනෙකුත් ආගමික වත්පිළිවෙත් වලදී දක්වන ගෞරවය




### උපුටා ගැනිම් හා විශ්ලේෂණයන් විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශයන්

### බුද්ධ ධර්මය

විෂය ඉගෙන ගැනිමේ අභිමතාර්යන් ලෙස සඳහන් වන්නේ ශ්‍රී ලංකික අනන්‍යතාව සුරකිමින් සාමය සහජිවනය ගොඩනැංවිම සඳහා අවශ්‍ය මඟ පෙන්විම සිදුකිරිමත්. බුදුන් ඉගැන්වු දසරාජ ධර්මයට අනුකුලව ආගමික සංහිදියාවෙන් කටයුතු කිරිමට මඟ පෙන්විමත් යන්නයි.

### බුද්ධ ධර්මය විෂයක් ලෙස ඉගෙන ගැනිමේ අධ්‍යාපනික අරමුණු

### විෂය නිර්දේශයට අනුව

- පුද්ගල අයිවාසිකම් සහ වගකිම් පිලිබඳව දැනුම වර්ධනය
- මානවවාදි සමාජයක් බිහිවිමට අවශ්‍ය වට පිටාව නිර්මාණය කිරිම
- සමාජයේ එකිනෙකා සමඟ සබඳතා පැවැත්විම සහ සමාජය ආකර්ශණය කර ගැනිම

සමාජයට හිතකර පුද්ගලයකු බවට පත් විම යන කරුණු සඳහන්කර ඇත.
විෂය මාලාවන් හි මඟපෙන්විම මෙසේ වුවත් ප්‍රායෝගික තලයේදි මෙම අරමුණු කෙරෙහි අවධානය යොමු කර ඇති බව නොපෙනේ.

## කතෝලික ධර්මය විෂයක් ලෙස ඉගෙන ගැනිමේ අධ්‍යාපනික අරමුණු

- සමාජ ප්‍රශ්න ක්‍රිස්තයානි දහම තුලින් හඳුනා ගැනිම
- කතෝලික සභාවේ ඉතිහාසය අධ්‍යනය කිරීම
- මානව සබතා වර්ධනය
- බහු ආගමික සමාජයක අන්තර් ආගමික සබඳතා සංවර්ධනය
- ආගම් අතර මාජ අනුකලනයක් පාසලේදි ගොඩ නැගිම
- මෙම අරමුණු පාසැල් තුල ක්‍රියාත්මක වන්නේ අඩු මටටමකින් බව සමීක්ෂණයෙන් තහුවරු විය.

## ඉස්ලාම් ධර්මය විෂයක් ලෙස ඉගෙන ගැනිමේ අධ්‍යාපනික අරමුණු

- බහු වාර්ගික හා ආගමික සමාජයක සුළුතරයක් ලෙස ඉස්ලාම් අනන්‍යතාව සුරකිමින් අනෙකුත් ආගම් වලට ගරු කිරිම
- බහු වාර්ගික හා ආගමික සමාජයත් පිලිබඳව අවබෝධයක් ලබා ගැනිම
- ආගමික සහ වාර්ගික එකමුතුකම වෙනුවෙන් සමිති ගොඩ නැංවිම
- විවිධ ආගමික පසුබිමක් පැවැතියද, අපි සැම එකම මූලයකින් පැවත එන බව සිතීම

කෙසේ නමුත් විෂය මාලා සහ මාර්ගෝපදේශ ඉතාම පළල් ජාතික අරමුණු වලින් ගොඩ නැංවී තිබුනද, එහි අරමුණු පිලිබඳව විධිමත් දැනුවත්භාවයක් ගරුවරුන් හෝ ශිෂ්‍යයන් තුල ඇති බවක් නිරීක්ෂනයෙන් හෙලි නොවුනි. මේ නිසා විෂය උගන්වන ගුරුවරුන් හරහා ආගම් වාදි අදහස් ජනිත කිරීමට උත්සහ ගත් අවස්ථා පවා තිබුනු බව තහවුරු විය. ඉස්ලාම් බාලිකා පාසලක මහනුවර ඉගෙනුම ලබන හින්දු දරුවන් තමන්ගේ ආගම ලෙස ඉස්ලාම් හැදෑරීමට සිදුවි ඇති අතර කුඩා කල සිට දරුවන්ට තමන් විශ්වාස නොකරන ඇදහිල්ලක නිරත වීමට පරිසරය සකස්කර ඇත. එසේම මහනුවර බෞද්ධ බාලිකා පාසැලක අධ්‍යයනය ලබන ඉස්ලාම් සහ වෙනත් ආගමික දරුවන්ට බෞද්ධ ආගමික වතා පිටාවක ජිවත් වීමට සහ විෂයක් ලෙස බුද්ධ ධර්මය හැදෑරීමට සිදුවි ඇත. මේ තත්ත්වය මත ආගම විෂයක් ලෙස පාසැල් තුල ඉගෙන ගැනිමට සිදුවිම නිසා හිංසාකාරි ස්වභාවය නිතැනින්ම ඇති වි තිබේ.

## උපුටා ගැනිම් විශ්ලේෂණයන් චක්‍රලේඛණ

ආගමික ඇදහිම මත පදනම් ව විවිධ අකටයුතුකම් මතුවිම සඳහා අධ්‍යාපන විෂය මාලාවන් ප්‍රධාන ආයුධයක් ලෙස ශ්‍රී ලංකාවේ යොදා ගැනිම සම්බන්ධයෙන් සොයා බැලිම සඳහා සිදුකරන ලද, අධ්‍යයනයේදි, පරිපාලන අංශයන්හි සිදුවන මැදිහත් විම් සොයා බැලිමට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කලාප ප්‍රධානින් සහ පලාත් ප්‍රධානින් සමඟ සාකච්ජාවන් පවත් වන ලද, අතර විදුහල්පති වරුන් කිහිප දෙනෙක්ද, අදහස් දැක්විමට ඉදිරිපත් විය. මේ අනුව ඔවුන් පරිපාලන කටයුතු සඳහා භාවිතා කරන චක්‍රලේඛණ සහ නියෝග දැන්විම් වලට අනුව කටයුතු කරන බව තහවුරු විය. අනෙක් අතට විදුහල්පති සහ පරිපාලන අංශයන්හි ප්‍රධානින්ගේ ආගමික දෘෂ්ඨින් පරිපාලන කටයුතු සඳහා බලපාන බව දැක්විය හැක.

අතට විදුහල්පති සහ පරිපාලන අංශයන්හි ප්‍රධානින්ගේ ආගමික දෘෂ්ඨීන් පරිපාලන කටයුතු සඳහා බලපාන බව දැක්විය හැක.

## සිසු දරුවන්ට නැරඹීම සඳහා චිත්‍රපටි නිර්දේශ කිරිමේදි

- නිහතමානි ආකල්ප සංවර්ධනය විමට බලපාන
- සමබර පෞරුෂයක් පවත්වාගන යා හැකි
- ආගමික දෘෂ්ඨීන් සහ සමාජ ආයතන ඉලක්ක නොවන එවා විය යුතු

නමුත් ප්‍රදර්ශනය කරන බොහෝ චිත්‍රපටි ඓතිහාසික බෞද්ධ සම්ප්‍රදායේ මූලිකාංග වලට අයත් කථාංග බව නිරික්ෂණයෙන් හෙලිවිය.

## ශිෂ්‍ය පාර්ලිමේන්තුව ස්ථාපිත කිරිම

සහජිවනය ගොඩ නැංවිම සඳහා හොද පිටුබලයක් සහ අරමුණ රාශියක් සඳහන් කර ඇතත් ප්‍රායෝගකව ඒම අදහස් සැලකිල්ලට ගෙන ඇති බවක් නොපෙනේ. උගත් පාඩම් කොමිසමේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරිම, ජාතින් අතර එකමුතුකම ගොඩ නැංවිම වැනි අරමුණු ඒ අතර වේ. ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ අමාත්‍යංශයක් ලෙසද ආගමික සංස්කෘතික කටයුතු හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යංශයක් ස්ථාපිත කිරිමට යෝජනා කර ඇත.

වෙසක් දින සැමරුම් පැවැත්විමට බෞද්ධ පාසැල් වලට නිර්දේශ කර ඇතිවාක් මෙන්ම විශේෂයෙන් නබි දින සැමරුම සඳහා ඉස්ලාම් පාසල් වලට චක්‍රලේඛණ ඒවා ඇති බව අධ්‍යයනයෙන් හෙලිවිය.ආගමික උත්සව සැමරුම් පාසැල් වල පැවැත්විමෙන් එම ආගම් වලට අයත් නොවන දරුවන් බලපෑමකට ලක් විය හැක. ගරු මාර්ගෝපදේශ සංග්‍රයන් සහ ජාතික භාෂා වැඩ සටහන් ආදි ක්‍රියාකාකරම් පිලිබඳව දක්වන ලද නිවේදනයන්හි පවා ඇත්තේ ජාතික ඒකාබද්ධතාවය ගොඩ නැංවිමට අවශ්‍ය මඟපෙන්විම් වන අතර නිරික්ෂණයන් හිදි හෙලි වුයේ ක්‍රියාත්මක කිරිමට යාමේදි ඇති වන ව්‍යාකූල බව ගැටළු ඇති කරන බවයි.

ගුරුවරුන්ගේ ආචාරධර්ම වල වැදගත් කරුණක් ලෙස සඳහන් වි ඇත්තේ ජාතිය ආගම කුලය පන්තිය ස්ත්‍රි පුරුෂ සමාජභාවය භාෂාව ආදිය නොසලකා සෑම දරුවකුටම සමානව සැලකිය යුතු බවයි. නමුත් නායකත්වයන් ලබා දිමේදි සහ වෙනත් ව.කිම් පැවරිමේදි ආගමික සංකල්පයන් ඉස්මතු වන බව පෙනුණි. නිරික්ෂනයෙන් හෙලිවුයේ ඇතැම් පාසැල් වල ප්‍රධාන ශිෂ්‍ය නායකයා වැනි තනතුරුවලට බෞද්ධ ශිෂ්‍යයන් පමණක්ම පත් කිරිමට වග බලා ගන්නා බවයි. එසේම සෙසු පාසැල් වලද ආගමික පදනම මත එවැනි තීරන ගන්නා බව තහවුරු විය.

චක්‍රලේඛ නිවේදන ආදිය විමර්ෂනය කිරිමේදි පෙනි යන්නේ ඒවා ආගමික හිංසනයන් වාර්ගික වෙනස්කම් නොසලකා හැර කටයුතු කිරිමට මගපෙන්වා ඇතත් සිංහල පාසැල් වල ඉගෙනුම ලබන බෞද්ධ නොවන දරුවන් බෞද්ධ ආගම ඉගෙන ගැනිමට සිදුවිමත් ඉස්ලාම් බාලිකා පාසැල වල ඉගෙනුම ලබන සෙසු දරුවන්ට ඉස්ලාම් සංස්කෘතික ලක්ෂණ අනුව ඇඳුම ඇඳිමට සිදුවිමත් වැනි දේවල් පිලිබඳව කනගාටුවෙන් අදහස් පලකරනු ලැබුනි.
සිංහල පාසල් වල ඉස්ලාමීය දරුවන්ට සිංහල භාෂාව ඉගෙන ගත හැකිය. ඉස්ලාමීය පාසල් වල අධ්‍යාපනය ලබන සිංහල හා හිංදු දරුවන් ඔවුන්ගේ ආගම ඉගෙන ගැනීමට නොහැකි වී ඇත. ඉස්ලාමීය පාසල් වල ඉගෙනුම ලබන සියලුම ගැහැණු ළමයින් ඉස්ලාමීය ආගමික ඇදුමකින් සැරසී සිටිය යුතුය.

එසේම ආගමික සහ ජනවාර්ගික පදනමකින් දරුවන් පාසැල වලට ඇතුලත් කර ගැනිමේ නිර්ණායක සකසා තිබිම තුලින් ගැටලුකාරි තත්වයන් ඉස්මතු කර ඇති බව හෙලිවේ. සමාජයේ ඇති විවිධ ආගමික සංවිධානවල ක්‍රියාකාරකම් පාසැල තුලට කාන්දු විමට ආගමික ක්ෂේත්‍රය පාසැල තුල තිබිමෙන් බලපෑමක් වි ඇත. ආගමික කණ්ඩායම් වල බලපෑම විද්‍යාලයන් හි පරිපාලන කටයුතු වලට පවා බලපාන බව දැක ගත හැකිය. ඇතැම් පාසැල් වල විදුහල්පතිවරුන් පත්කිරිමේදි පවා ආගමික ක්ෂේත්‍රයේ බලපෑම් සිදුවන බව නොරහසකි.

## උපුටා ගැනිම් විශ්ලේෂණයන්

### පුවත්පත්

ආගමික සහජිවනය ගොඩ නැංවිමට අවශ්‍ය පුවත්වලට වඩා වාර්ගික සහ ආගමික හිංසනයන්ට අදාල පුවත් සඳහා වැඩි ඉඩ කඩක් ලබා දෙන බව හඳුනාගත හැක. ආගමික වෛරි කතා හිංසනයට ලක්කරන නිවේදන ආදිය පුවත්පත්ත වල බහුලව ප්‍රකාශයට පත් කරන බව තහවුරුවේ. පාසැල් විෂය ක්ෂේත්‍රය සැලකිල්ලට ගත් විට පාසැල් ජාතිකත්වය මත හඳුන්වාදිමක් කිරිමට පුවත්පත් උත්සහ දරයි. උදාහරණ ලෙස නාවල පිටිය දෙමල විදුහල, මන්නාරමේ මුස්ලිම් පාසැල වැනි යෙදුම් බහුලව දැකිය හැකිය.

### යෝජනා සහ නිර්දේශයන්

ආගමික අධ්‍යයන ඉගැන්විම ගඩොලින් ගෙයක් නිර්මාණය කරන හා සමාන බව විද්වතුන් පවසයි. නිවසක් ගඩොලින් ගඩොල අත්තිවාරමේ සිට ක්‍රමනාකුලව ගොඩනැගියි යුතුවේ. එක් ගලක් හෝ ශක්තිමත් නොවුනහොත් මුළු නිවසම අවධානමට ලක් වේ. රටක ආගමික සහ වාර්ගික සංහිඳියාව ගොඩ නැංවිමට ආගමේ මුලිකාංග අවශ්‍ය වන නමුත් විෂයක් ලෙස ආගම ඉගැන්විම වැදගත් නොවේ. පෙර පාසල් අවධියේ සිට ආගම් වලට ගරු කිරිමට අවශ්‍ය මග පෙන්විම සෑම දරුවෙකුටම කල යුතුය.ආගම් වල ඇදහිල්ල හෝ විශ්වාසය බලෙන් ඇති කල යුත්තක් නොවන අතර ඒ සඳහා නිදහස තිබිය යුතුවේ. රටක් සංවර්ධනය විමේදි ආර්ථික ස්ථායිතාව මෙන්ම අධ්‍යාත්මික සංවර්ධනයක්ද තිබිය යුතුවේ.

## ආගමික සංහිඳියාව ගොඩ නැංවිමට ගුරුවරුන් සඳහා නිර්දේශයන්

- පන්ති කාමරය තුල ආගම අතර අන්‍යෝන්‍ය අවබෝධය වර්ධනය කිරිම
- අනිකුත් ආගමික විශ්වාසයන් පිලිබඳව කතා කිරිමට ඉඩ නිර්මාණය කිරිම
- ආගමික පුරුදු ඇදහිලි පිළිබඳව වැරදි අවබෝධයන් නිවැරදි කිරිම
- සෑම ආගමක්ම ඉගෙන ගැනිමට දරුවන් උනන්දු කරවිම
- සතියකට වතාවක් සෙසු ආගමික සංකල්ප ඉගැන් විම
- ආගමික ස්ථාන නිරික්ෂණ චාරිකා සංවිධානය කිරිම

## ප්‍රතිපත්ති සම්පාදකයන් සඳහා වන නිර්දේශයන්

- පැහැදිලි ජාතික භාෂා ප්‍රතිපත්තයක් ස්ථාපිත කිරීම
- විනිවිද භාවයෙන් යුතු සැලසුම් සහ අධීක්ෂණ කමිටු ස්ථාපිත කිරීම
- ගුරුවරුන් බඳවා ගැනීම ස්ථාන මාරු ප්‍රතිපත්ති ආගමික වෙනස්කම් වලින් තොරව එවැනි සංකල්ප ඇති ලැදියා කණ්ඩායම් වලට අවනත නොවන තිරණ ගැනීම
- ආගමික සහජිවනය ගොඩ නැංවීමට පාසැල් වල සම්පත් සහ අවකාශ වැඩි කිරීම
- විෂය මාලාවෙන් එක් ආගමක් ඉගැන්වෙන තත්ත්වය වෙනස් කර සර්වගාමික විෂය මාලාවක් හදුන්වා දිම හෝ සමායන්තර ආගමික විෂය නිර්දේශයක් හඳුන්වා දිම
- අපොස සාමාන්‍ය පෙල විභාගයට තමන්ගේ ආගම විෂයක් ලෙස ඉල්ලීමට අවකාශ සැලසීම උදාහරණයක් ලෙස බෞද්ධ පාසැල් වල ඉගෙන ගනු ලබන ඉස්ලාම් සහ කතෝලික දරුවන්ට තමන්ගේ ආගමට අදාල විෂයට පෙනි සිටිමට නීති සැකසීම
- පාසැල් වලට දරුවන් ඇතුලත් කර ගැනිමේදි ආගමික සහ ජනවාර්ගික අනුපාතය ඉවත් කිරීම
- ආගම පදනම් කර ගත් පාසැල් ඇරඹීමට කටයුතු නොකිරීම
- පාසල්වල ආගම් ඇදිහිමට පොදු මධ්‍යස්ථානයක් ගොඩ නැගීම
- පෙල පොත් සර්වගාමික සංකල්ප ඇති ලෙස දියුණුකිරීම
- සාමුහික වන්දනයන් ,ආගමික ග්‍රන්ථ සියල්ලක්ම පරිශීලනය කිරීමට පසුබිම සැකසීම වැනි කරුණු ඉටු කිරීමෙන් වාර්ගික සහ ආගමික හිංසනයන් අධ්‍යායපන ක්ෂේත්‍රයෙන් ඉවත් කර ගැනිමට මූලික පියවරයන් ලෙස ආරම්භ කල හැකිබව නිර්දේශ කරමු.

ශාස්තිය සමාලෝචනය අධ්‍යයනය කරන ලද විෂය ක්ෂේත්‍රයට අදාල අන්තර් ජාල උපුටා ගැනිම් සහ විෂයට තේමාවට අදාල ගන්ථ, පර්යේෂණ නිබන්ධන අග්‍රියෙන් උපුටා ගෙන ඇති බන කරුණාවෙන් සලකන්න. එම උපුටා ගැනිම් සංස්කරණයෙන් තොරව එලෙසම පලකර ඇත.

## 02. LITARTURE REVIEW

Number of studies which are related to my study can be found from different countries. BernadineHyde conduct study "*LEARNING STORIES AND DISPOSITIONAL FRAMEWORKS IN EARLY YEARS' RELIGIOUS EDUCATION "* Early childhood educators have for some time now questioned approaches to education that focus solely on the development of thinking and rational cogitation, and have begun to favor *dispositional* frameworks in preference to learning frameworks (Perkins, Jay & Tishman, 1993; Brooker, 2002; Fisher with Claxton & Price, 2006). For although the acquisition of knowledge, skills and abilities is an essential facet of education, contemporary research indicates that the act of learning extends beyond rational thinking and concerns other non-cognitive dimensions (see for example de Souza, 2006; Buchanan & Hyde, 2008; Groome, 1998; Palmer, 1998). However, there is little evidence to suggest that dispositional frameworks have been utilized in religious education with early years' students in Catholic primary schools1. This presents a challenge for contemporary religious education in the early years' classrooms in which outcomes based philosophies focus upon demonstrable competencies as opposed to the *processes* or dispositions students utilize in their learning.

According to Scholar article in *"*ENGAGING THE SECONDARY SCHOOL STUDENT IN RELIGIOUS EDUCATION" *Kerry Ang said* to be an effective Religious Education teacher, you must engage with your students. This doesn't mean you have to try and be one of them, or like everything they like, or be knowledgeable on all of current youth culture (they might see that as "tragic"). Rather, you need to let them know that you like them, value their interests, and enjoy being with them. Students work for teachers that they like. Be a teacher of young people first, and of curriculum second.

For teachers to successfully engage students today, they first need to have a clear understanding of both the nature of the prevailing youth culture, and an understanding of how young people think and learn during adolescence. It is during this critical time in the lives of students when their patterns of thinking and behavior are established. Armed with this knowledge and understanding, the secondary school teacher, then, needs to achieve the four essentials needed to engage students: knowledge (pedagogical content knowledge and pedagogical learner knowledge); authenticity (not only must the Religious Educator's style must be credible, but the communicator himself/herself must be also); relevance (of lesson content to the lives of students and style of presentation); and relationships (the greater part of teaching is about building and sustaining relationships).

If these four essentials can be achieved in the Religious Education classroom, students will be engaged in their learning, which in turn will lead to higher quality intellectual work and a more enjoyable and productive educational experience for both the teacher and student. Teaching is a profession where success usually comes in very small increments. But the reward for such hard won success is that it resonates in the students' lives long after a lesson or year is concluded.

According to Scholar article in *Leona M. English said* **Transformative Learning and Religious Education** Taylor (2008) observes that transformative learning theory has been developed in detail for the past 30 years, with theorists working with contexts and related themes such as critical social action, environmental change, and spirituality. Significantly, the latter perspective on spirituality bears few links to a religious context, except in a historical sense, and comes closer to what most would think of as holistic knowing (see English & Tisdell, 2010). Spiritualty is seen as a learning dimension that must be recognized when working with adults.

When one considers that religious education literature has been concerned, at least in the past, with gender, feminism, and women's learning, it is somewhat surprising to see how scant that literature is in relation to transformative learning. In the few cases where the theme of transformative learning is applied in religious education the results are quite helpful. Fleischer (2006), for instance, makes

Reference of "International Handbook of Learning, Teaching and Leading in Faith-Based Schools" editor said analyses the place of religion across the landscape of Singapore school curricula, leadership and policy making. In so doing, it first provides a social, political, economic and demographic context to Singapore as a small multi-ethnic, multi-faith island republic. Its strongly authoritarian and secular government prioritizes the twin goals of social harmony and a workforce equipped with the skills to be a leading global twenty-first century, knowledge-based economy. Education is seen instrumentally by the government as a crucial vehicle to meeting both goals. Thus, the central argument is that for a large majority of the 360 schools in the system, there is no place for religion in the curriculum, since it is regarded as potentially divisive to social harmony; rather, social, moral and citizenship (National) education are emphasized for their apparent greater congruence with the government's twin goals. However, such government policy creates tensions for the Malay-Muslim minority, some of whom prefer their children to be educated in madrasahs, of which there are currently six. A dichotomy thus exists for such schools between the desire for an Islamic religious education and the government's priority for a modern academic curriculum. The chapter identifies the various ways in which the government manages such tensions to engineer the 'state interest', and the premium placed on skilful leadership at all levels to navigate and finesse the sensitive boundaries between faith and state.

According to the NCEASL report, on September 9, four officers from the religious affairs branch of the Divisional Secretariat in Kegalle visited the residence of the Good Shepherd Gospel Centre's (GSGC) pastor on the basis of

several petitions submitted against the pastor and the GSGC. The officers instructed the pastor to register the GSGC and threatened to seal the premises if he refused.

Religion remained a compulsory subject in the public school curriculum. Parents could elect for their children to study Buddhism, Islam, Hinduism, or Christianity. Students could not opt out of religious instruction. All schools followed the Ministry of Education curriculum on religion, which remained compulsory for the General Certificate Education Ordinary-Level (equivalent to U.S. grade 12) exams covering the four main religions. Government schools frequently experienced a shortage of teachers, sometimes requiring available teachers to teach the curriculum of a different faith. International schools

26

following the London Ordinary-Level syllabus remained governed by the Board of Investment and could opt not to teach religious studies in schools, as students could pass without religion.

Some anonymous article express under current policies in effect, the Department of Education of Sri Lanka requires that all children in public schools to be religiously indoctrinated from kindergarten through junior high school (grade 10). We firmly believe this is unconstitutional even under the fundamental rights provisions in the current Constitution in Sri Lanka, and this should be challenged in Supreme Court by secular parents and children. Under current public education policies placed in practice nationwide, a parent or child has no choice in this enforced religious education, and to prevent his or her child from religious education, except for choosing between the mainstream religions of Buddhism, Hinduism, Christianity and Islam. Freedom for Religion shall include Freedom From Religion, and this religious education can be challenged in the Supreme Court by qualifying parents and children. G.C.E. O/L examinations conducted by the Department of Education requires every student to take an examination in one of the four mainstream religions without giving a choice to opt out. This practice violates the rights of non-believers even under the current Constitution of Sri Lanka.

We firmly argue that public tax payer money shall not be spent on religious indoctrination inside public schools. Religious education is a matter to decide by the private citizens and government should have no right to participate in enforcement or providing a landscape for entertaining religious dogma within public tax payer funded educational institutions. A parent or a child who wish to participate in any religious learning may be left free to attend private religious schools in Buddhist Temples, Kovils, Mosques or any other privately funded institutions that provide such services outside of the public school network.

Teaching 'Religions of the World' inside schools is another topic that is widely discussed. This form of comparative study may not be harmful as long as the practice of it guaranteed to be fair, includes all religions, and not enforced as mandatory requirement. We think such avenues for comparative religion as a subject needs further research and studies, and some secularists have suggested this alternative approach would open doors for people to think about other people's religions. Implementation of a fair and impartial environment inside public schools to foster comparative religion is out of reach under current social and political environment in Sri Lanka. Teaching all major religions in equal proportion and setting as a comparative study may be a good start to further social reforms. In many countries such comparative religion courses are available at university level, and this is an area that needs further consideration by the academic community and public educators. We also think such allowances may need to be a topic to address after Sri Lanka becomes a truly secular society.

## Religious discrimination in schools and colleges

It's against the law for a school or college to discriminate because of religion or belief when it decides on who should be accepted as a pupil or student. This applies to both state and independent schools and colleges. However, it doesn't apply to faith schools. Once you have been accepted as a pupil or student at the school or college, it's against the law for them to discriminate against you because of your religion or belief. For example, you can't refuse to let someone be a prefect, give them detention or extra homework just because of their religion or belief.

## School uniform

Rules about school uniform must not discriminate against you because of your religion. For example, if you're a young Islam man, you must be allowed to wear a turban at school as this is part of your faith. However, this doesn't mean that a school has to allow all items of religious dress. Schools can have a uniform policy which prevents pupils wearing certain things. They might, for example, do this for health and safety reasons.

## The curriculum

The law about religious discrimination does not apply to what is taught in schools (the curriculum). For example: a school is allowed to teach evolution theories even if these theories go against the religious views of some parents it isn't against the law for religious education lessons in schools to teach mainly about Christianity. However, teachers must also take into account the other main religions. This doesn't apply to faith schools.
Christianity. However, teachers must also take into account the other main religions. This doesn't apply to faith schools.

Anthropology and Education magazine published article express "**Muslim** Youth in Canadian Schools: Education and the Politics of Religious Identity"

This article provides an ethnographic analysis of the schooling experiences of Muslim youth in Canada who are committed to maintaining an Islamic lifestyle despite the pressures of conformity to the dominant culture. Little attention has been paid to how religious identity intersects with other forms of social difference, such as race and gender in the schooling experiences of minoritized youth. Using a case study often Muslim students and parents, this article demonstrates how Muslim students were able to negotiate and maintain their religious identities within secular public schools. The participants' narratives address the challenges of peer pressure, racism, and Islamophobia. Their stories reveal how Muslim students are located at the nexus of social difference based on their race, gender, and religious identity. The discussion further explores the dynamics through which these youth were able to negotiate the continuity of their Islamic identity and practices within schools despite the challenges that they faced. Building upon existing theories of identity maintenance and construction, this research demonstrates how the interplay of the core factors of ambivalence, role performance, and interaction and isolation are implicated in the way Muslim students negotiate the politics of religious identity in their schooling experiences.

## Bibliography

International Movement Against All Forms of
Discrimination and Racism-Asia Committee

EUROPEAN UNION

අංක: 1149A, කෝට්ටේ පාර, රාජගිරිය,ශ්‍රී ලංකා
දුරකථන අංකය: ( + 94-11) 5757323
ෆැක්ස්: ( + 94-11) 2884559
E-mail: info@imadr.org